**විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - 2019**

**-------------------------------------------------------------**

විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3409-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV වාවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විදුලි බලය සැපයීමේ හා බෙදාහැරීම් පද්ධතිවල කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයබව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. (අ) හුදකලා දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති ජාලක ස්ථාපනය (ආ) මධ්‍ය වෝල්ටීයතා ජාලයේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම (ඇ) ග්‍රාමීය විදුලිබල පද්ධතිය පුළුල් කිරීම සහ(ඈ) බෙදාහැරීමේ කාර්යසාධනය නියාමනය වැඩිදියුණු කිරීම සහ සම්ප්‍රේෂණ පද්ධතියේ ප්‍රතික්‍රියාකාරී බල කළමනාකරණය වැඩිදියුණු කිරීම යනාදී සංරචක 4 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 23,069 කට සමාන එජඩො මිලියන 160.20 ක් වන අතර, ඉන් රු.මිලියන 16,560 කට සමාන එජඩො මිලියන 115 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 6,508.8 කට සමාන එජඩො මිලියන 45.2 ක් මූල්‍යනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුනි 29 දින ආරම්භ කරන ලද අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන ගැටළු | මුදල | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | ----------- | ------ | -------- | ----------------- | ---------- |
| | | රු.මිලියන | | | |
| (අ) | ලංකා විදුලිබල මණ්ඩලයේ වැඩි දියුණු කිරීමේ සහ නඩත්තු කටයුතු කිරීමේ අරමුණු සඳහා පැකේජ 1 – 5 යටතේ මිලදී ගන්නා ලද තොග කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට ව්‍යාපෘතියේ තොග වටිනාකම තුල ඇතුලත් කර තිබුණි. තවද සඳහන් ගබඩා මගින් හෝ ව්‍යාපෘති කළමණාකරන ඒකකය මගින් භෞතික සත්‍යාපනයක් සිදු කිරීම මගින් ශේෂයක් තහවුරු කිරීමට නොහැකි වීම නිසා විගණනයේදී එය සත්‍යාපනයට සහ පිළිගැනීමට නොහැකි විය. | 3,323.38 | තොග ශේෂය වැඩියෙන් දැක්වේ. | රු.මිලියන 3,323.38 ඉතිරි තොගය (රු.මිලියන 3,374.48 න් රු.මිලියන 51.1 අඩු කිරීමෙන් පසු) ශේෂය ලංකා විදුලිබල මණ්ඩලය වෙත විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන ව්‍යාපෘතියේ පැකේජ 1,2,3,5 මගින් සපයා ඇත. SESRIP ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව පැකේජ 1,2,3 සහ 5හි අරමුණු වන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ වැඩිදියුණු කිරීමේ හා නඩත්තු කටයුතු සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාණ්ඩ සැපයීම වේ. පැකේජ 1,2 හා 3 යටතේ කටයුතු බෙදා හැරීමේ අංශ 2 මගින් සිදු කර ඇත. ගිවිසුම් අත්සන් කරන අවස්ථාවේදී ආසියානු සංවර්ධන බැංකුව සමග එකග වූ පරිදි අමු ද්‍රව්‍ය ලංකා විදුලිබල මණ්ඩලයේ පළාත් ගබඩා වෙත බෙදා හැර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘතියට අදාල තොග දැක්වීමට අවශ්‍ය වේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 3,374.48 ක් වටිනා තොග වටිනාකම තුල කොන්ත්‍රාත්කරුට අයත් රු. මිලියන 51.1ක් වටිනා තොග ඇතුලත්කර තිබුණි. එම නිසා මූල්‍ය පුකාශනවල තොගවල වටිනාකම රු. මිලියන 51.1කින් වැඩියෙන් දක්වා තිබුණි. | 51.1 | තොග ශේෂය වැඩියෙන් දැක්වේ. | රු. මිලියන 51.1 වටිනා තොග SESRIP ව්‍යාපෘතියේ පැකේජ 4 යටතේ ආනයනය කර ඇත. පැකේජ 4 කෙරීගෙන යන වැඩ යටතට මාරු කිරීමට පියවරගනු ලැබේ. | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | පෙර වර්ෂයේ විගණන වාර්තාවේ සත්‍යාපනය නොකරන ලද ශේෂය ලෙස වාර්තා කරන ලද 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද අනෙකුත් අංශවලට අදාල එකතුව රු. මිලියන 842.88 ක වැඩ වලංගු හේතු දැක්වීමකින් තොරව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබුණි. | 842.88 | කෙරීගෙන යන වැඩ අත්හැරී ඇත. | පළාත් ගබඩාවලට සපයන ලද අමුද්‍රව්‍ය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කරන ලද අමුද්‍රව්‍ය අනෙකුත් අංශවල කෙරීගෙන යන වැඩවල දැක්වීය. ලංකා විදුලිබල මණ්ඩලයේ ඉදිකිරීම් කටයුතු සඳහා අමුද්‍රව්‍ය සපයා තිබුණු අතර එම නිසා අමුද්‍රවය ලැබීම් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇත. | වර්තමානයේ පළාත් ගබඩාවලට කිසිදු ශේෂයක් සනාථ කිරීමට නොහැකි නිසා ව්‍යාපෘතිය විසින් සපයන ලද අමුද්‍රව්‍ය හඳුනා ගැනීමට පළාත් ගබඩාවල වෙනමම ලේඛණ පවත්වා ගැනීමට උපදෙස් ලබා දිය යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතියේ ආරම්භයේ සිටම ව්‍යාපෘතිය විසින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 84.62ක් වටිනා වෙළඳ හා අනෙකුත් ගෙවීම්වල සවිස්තරාත්මක වාර්තා පවත්වගෙන නොතිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 84.62 ක වෙළඳ හා අනෙකුත් ගෙවීම්වල වටිනාකම් විගනනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | 84.62 | වෙළඳ හා අනෙකුත් ගෙවීම් වටිනාකම්වල නිවැරදිභාවය පිළිබඳව සැක පවතී. | අදහස් දක්වා නොමැත. | ශේෂයන් සනාථ කිරීමට නිසි පරිදි පොත්පත් සහ වාර්තා පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | පුද්ගලික සමාගමකින් සෘජුවම ලැබුණු ශේෂය සනාථ කිරීමේ ලිපියට අනුව 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් එකතුව රු.මිලියන 17.39 ක් පියවීමට අවශ්‍ය වන අතර ඉහත සඳහන් සමාගම වෙනුවෙන් ගෙවිය යුතු ශේෂය ලෙස රු.මිලියන 16.54 ක් දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීය. | 0.85 | ගෙවිය යුතු ශේෂය අඩුවෙන් දැක්වේ. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය ගෙවිය යුතු ශේෂය දැක්වීම පියවර ගත යුතුය. |
| (ඊ) | ලංකා විදුලිබල මණ්ඩලයේ දායකත්වයෙන් වියදම් කරනු ලැබුවද විගණනයේදී ගෙවීම් උපලේඛන, වවුචර් හා ජර්නල් සටහන් යනාදී ප්‍රමාණවත් විගණන සාක්ෂි නොතිබුණි. | 290.69 | දරණ ලද වියදම්වල නිවැරදිභාවය පිළිබඳව සැක පවතී. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් යොදන ලද ප්‍රාග්ධනයේ විස්තරය අමුණා ඇත. ඇමුණුම03 | වියදම් සත්‍යාපනය කිරීමට නිසි පරිදි පොත්පත් සහ වාර්තා නඩත්තු කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 නීතී,රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | ------------ | --------------- | --------- | --------------- | ---------- |
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 7 | ව්‍යාපෘතිය මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පැකේජ 7 අදාල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ ව්‍යාපෘති සංවර්ධන පිරිවැය (WIP) සලකා නොතිබුණි. | ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ මුදල් හා මුදල්වල සමාන දෑ වලට වන නියම බලපෑම තක්සේරු කිරීමට නොහැකි වේ. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 16 | 2002 වර්ෂයේ මිලදී ගත් WP GB 9464 කාරයක් සහ 2012 වර්ෂයේදී මිලදීගත් WP PE 5057 දරණ ඩබල් කැබ් රථය ඇතුළුව සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වාහන එමවාහනවල ආර්ථික ඵලදායී ජීව කාලය ඇගයීමකින් සහ ඒ අනුව ගිණුම්ගත කිරීමකින් තොරව ව්‍යාපෘතිය විසින් අඛණ්ඩව භාවිතා කරමින් පවතී. | දේපල, පිරියත හා උපකරණවල වටිනාකම අඩුවෙන් දැක්වේ. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 1646 | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ගමන් විස්තර විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වුවද සපයා නොතිබුණි. | වාහන ඉන්ධන සහ තෙල් සඳහා දරණ ලද එකතුව රු. මිලියන 1.3ක වියදම විගණනයේදී සත්‍යාපනය කල නොහැක. | අදහස් දක්වා නොමැත. | රෙගුලාසි සමග අනුකූල විය යුතුය. |
| (ඈ) | මුදල් රෙගුලාසි 761 | විගණන සඳහා තොග පොත් ඉදිරිපත් කර නොතිබුණි. | පළාත් ගබඩාවල තොග ලෙස වාර්තා කර ඇති එකතුව රු. මිලියන 3,374.48ක් විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි | අදහස් දක්වා නොමැත. | රෙගුලාසි සමග අනුකූල විය යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | විය. | | | |
| (ඉ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2018 සැප්තැම්බර් 18 දිනැති පීඊඩී 01/2018 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | පිළිවෙලින් රු.මිලියන 23.4 සහ රු.මිලියන 153.5 පිරිවැය සහිත Sports Utility වාහන සහ four wheel driven double cabs 16ක් ඇතුළුව 2019 වර්ෂය තුලදී මිලදී ගන්නා ලද මෝටර් වාහන 17 සම්බන්ධයෙන් චක්‍රලේඛ අවශ්‍යතා අනුගමනය කර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා වාහන මිලදී ගැනීමේදී වාහනවල වෙළඳපල වටිනාකම සලකමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් බදු ඇතුළුව මිල උපරිමය තීරණය කර නොතිබුණි. (ව්‍යාපෘතිය ආරම්භක අදියරේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් සහිතව අදාල රජයට අයත් ව්‍යාපාර විසින් වාහන අවශ්‍යතාවය පැහැදිළිව හදුනාගත යුතුය) තවද, සභාපති සහ රේඛීය අමාතයාංශයේ ලේකම් මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් වාහන මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය අවසාන අදියරේදී වාහන මිලදී ගැනීමේ අවශයතාවය සහ ව්‍යාපෘතියේ කටයුතු ඉටුකර ගැනීමට අදාලනොවන Sports Utility වාහන මිලදී ගැනීමට අනාර්ථක වියදමක් දැරීම. | 2018/02/15 දින ටෙන්ඩරය ප්‍රසිද්ධ කර ඇත. විදුලි හා බලශක්ති අමාත්‍යංශයේ ස්ථාපිත කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් පසු ව්‍යාපෘතියේ වාහන අවශ්‍යතාවය ටෙන්ඩරයේ විෂය පථයට ඇතුලත් කර ඇත. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2018 සැප්තැම්බර් 18 දිනැති පීඊඩී 01/2018 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 03 වගන්තියට අනුව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඊ) | 2005.01.31 දිනැති පීඊඩී 23 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | කුලියට ගත් වාහන සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ දී කුලී ගාස්තු සඳහා එකතුව රු.මිලියන 27.04 ක් දරා තිබුණි. | අනාර්ථික වියදම් | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමට අවශ්‍ය වේ. |
| (උ) | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2019 මාර්තු 05 | රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ප්‍රධානත්වයෙන් සහ භාණ්ඩාගාර ලේකම් | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ කළමනාකරණ | ව්‍යාපෘති සමාලෝචන කමිටු පත්කර නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමට අවශ්‍ය වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 වගන්තිය | විසින් නම් කරන ලද නිලධාරියකු, ජාතික සැලසුම් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පවරා ඇති අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ලද නිලධාරියකු සහ අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමණාකරන සහ නියාමන දෙපාර්තමේන්තුව හෝ ඔහු/ඇය විසින් නම් කරන ලද නියෝජිතයකුගෙන් සමන්විත මාස දෙකකට වරක් පැවැත්විය යුතු ව්‍යාපෘති සමාලෝචන කමිටු ස්ථාපනයට පියවර ගෙන නොතිබුණි. | අධීක්ෂණයක් සහ නියාමයන් අඩු වේ. | | |
| (ඌ) | 2014 ඔක්තෝබර් 17 දිනැති පීඊඩී/ආර්ඊඩී/03/03/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ 3.1.7 සහ 3.2.7 වගන්තිවල සඳහන් විධිවිධාන | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොමැති අතර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතියට අයත් වත්කම්වල පැවැත්ම සහ තත්ත්වය පිළිබඳව විගණනයේ දී සත්‍යාපනය කළ නොහැකි විය. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදේශ අනුගමනය කිරීමට අවශ්‍ය වේ. |
| (එ) | මුදල් රෙගුලාසි 507 | දෙසැම්බර් 31 දිනට ගබඩා සහ ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනය සිදුකර නොතිබුණි. | විගණනයේ දී ගබඩාවල අයිතම්වල පැවැත්ම සහ තත්ත්වය පිළිබඳව සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | වාර්ෂිකව ලංකා විදුලි බල මණ්ඩලයේ සියළු ගබඩාවල භෞතික සත්‍යාපනය සිදුකර තිබුණු අතර සත්‍යාපන වාර්තා කිසිඳු ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කර තිබුණි. | ව්‍යාපෘති තොග සහ වත්කම් හඳුනා ගැනීමේ අරමුණින් දෙසැම්බර් 31 දිනට ගබඩා සහ ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනය සිදුකළ යුතු ය. |
| (ඒ) | මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2016 ජුනි 10 දිනැති 2016/02 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව නිසි නියාමන යාන්ත්‍රණය, ප්‍රමාදයකින් තොරව මහජනයා වෙත ප්‍රතිලාභ | වර්තමානයේ ව්‍යාපෘති විගණනය ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශ යටතේ පවතින | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වේ. |

| | |
|---|---|
| ලැබීමේ ප්‍රමාණය නිශ්චය කිරීම සහ ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය සනාථ කරගැනීම සීමා වීම. | අතර ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශයට අයත් සියළුම ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමට වගකියන විගණක වෙත වෙන්කර ඇත. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

ණය ගිවිසුමට අනුව, ග්‍රාමීය විදුලි සැපයුම් ජාල පුළුල් කිරීම සහ බෙදාහැරීම් කාර්යසාධනය නියාමනය සහ පන්නිපිටිය සහ බියගම පවතින කොටුමා උපපොළවල්වල ධාරිතාවය වර්ධනය ඇතුළුව මධ්‍ය වෝල්ටීයතා ජාලයෙහි විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීමට උතුරු පළාතේ නයිනාතිවු, ඇනලතිවු සහ ඩෙල්ෆ් දූපත්වල සුළං, සූර්ය, කාර්යක්ෂම ඩීසල් ජෙනරේටර් සහ බැටරි මඟින් දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම සඳහා ප්‍රධාන සංරචක 04ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, සැලසුම් කළ දිනය වූ 2016 ජුලි 31 දින සිට වර්ෂයක සැලකිය යුතු කාලපරිච්ඡේදයක ප්‍රමාදයන් සහිතව අදාල කටයුතු ආරම්භ කර තිබුණු අතර ප්‍රමාදයන් ආවරණය කරගැනීමට පියවර ගැනීමකින් තොරව මෙහෙයුම් කටයුතු සිදුකර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකයන් | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | ඇනලතිවු, ඩෙල්ෆ් සහ නයනාතිවු යන හුදකලා දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති කුඩා ජාලක තුනක් ඉදිකිරීම. | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, උතුරු පළාතේ ඇනලතිවු, ඩෙල්ෆ් සහ නයනාතිවු දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 තුන්වන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වූ අතර කොන්ත්‍රාත්තුවේ කටයුතු 2017 හතරවන කාර්තුවේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම | පිරිවැය වැඩිවීමට හැකි පරිදි ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට ඉඩ ඇත. | ඇනලතිවු සහ ඩෙල්ෆ් ඉඩම් කොටස් 2ක් රජයේ ඉඩම් වන අතර ඒවා මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇත. අදාළ දිස්ත්‍රික් ලේකම් 2018 මෙම ඉඩම් යොදා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. නයිනාතිවු ඉඩම පෞද්ගලික ඉඩමක් වන අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2020/7/21 දින එය මිලදී ගෙන ඇත. | ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනම් කල යුතු අතර තවදුරටත් ප්‍රමාද වීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | පැකේජයේ කෙටුම්පත් ලංසු ලියවිලි ADB විසින් 2017 ජුලි 4 දින අනුමත කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන තෙක් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුව යටතේ ඉඩම් කොටස් 3ක් මැනුම් කටයුතු කර තිබුණ ද විගණිත දිනය වූ 2020 ජුනි 03 දින වන විටත් ඉඩම් අත්පත් කරගෙන නොතිබුණි. | | | |
| (ආ) | මධ්‍ය වෝල්ටීයතා ජාලයේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව ඇස්තමේන්තුගත වටිනාකම එ.ජ.ඩො.මිලියන 34.99ක කිලෝමීටර 270.5ක් දිග කිලෝමීටර් 33 කුළුණු රැහැන් සහ කිලෝවොට් 33 සහිත ගැන්ට්‍රි 13 ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2016 වර්ෂයේ තුන්වන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වූ අතර කොන්ත්‍රාත්තුවේ කටයුතු 2017 හතරවන කාර්තුවේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය වර්ෂ 2කට වඩා ගෙන තිබුණි. අවසානයේ දී එ.ජ.ඩො. මිලියන 40.48 පිරිවැයකට 2019 මැයි 30 දින | පිරිවැය වැඩිවීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට ඉඩ ඇත. | SESRIP ව්‍යාපෘතිය සඳහා 2016 අප්‍රේල් ADB විසින් ප්‍රසිද්ධ කරන ලද නැවත පදිංචි කිරීමේ සැලැස්මට අනුව ADB අත්කර ගැනීම් හැර අවශ්‍ය ඉඩම් මිලදී ගැනීමට ප්‍රමුඛත්වය ලබාදීමට නිර්දේශ කර තිබුණි. එම නිසා ඉඩම් අයිතිකරුවන්ගෙන් මිලදී ගැනීමට හැකි සුදුසු ඉඩම් හඳුනාගැනීමට සියළුම පියවර ගෙන ඇත. විස්තර සහ එවැනි ඉඩම් කිහිපයක අයිතිකරුවන් පිළිබඳව හඳුනාගෙන ඇති අතර ADB ප්‍රසිද්ධ කරන ලද නැවත පදිංචි කිරීමේ | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව නියාමනය කිරීමට අවශ්‍ය වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර මෙම කොන්ත්‍රාත්තුවේ බලපැවැත්වෙන දින 2019 ජුලි 6 විය. මෙම සංරචකය යටතේ ගැන්ට්‍රි ඉදිකිරීමට ඉඩම් කොටස් 10ක් අත්පත් කරගැනීමට සැලසුම් කර තිබුණ ද වර්ෂ 3ක් ගතවීමෙන් පසුවද ඉඩම් කොටස් අත්කර ගෙන නොතිබුණි. තවද, විගණිත දිනය වූ 2020 ජුනි 01 දින වන විට ලංකා විදුලිබල මණ්ඩලය විසින් සියළුම රැහැන් මාර්ග 16ක මැනුම් කටයුතු අවසන් කර තිබුණ ද අදාල ප්‍රාදේශීය ලේකම්වරු විසින් රැහැන් මාර්ග 12 සඳහා පමණක් අනුමැතිය ලබා දී තිබුණු බව අනාවරණය විය. | | සැලැස්මට ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, විවිධ හේතුන් නිසා PMU ස්ථාපනය කිරීමට පෙර ව්‍යාපෘතියේ සැලසුම් අදියරේදී හඳුනාගත් සමහර ඉඩම් වෙනස් කිරීමට සිදු විය. | |
| (ඇ) | ග්‍රාමීය විදුලිය සැපයීම සහ බෙදාහැරීමේ කාර්යසාධනය නියාමනය | කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 26 දින පිරිනමා තිබුණ ද, පෞද්ගලික සමාගම් 2කින් පැකේජ 01 සහ 02 යටතේ කණු සහ මීටර බහාලුම් පෙට්ටි සැපයීමේ සහ බෙදාහැරීමේ අනවශ්‍ය ප්‍රමාදයක් පවතින බව නිරීක්ෂණය විය. පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල දී ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් අවශ්‍ය පියවර ගෙන | කොන්ත්‍රාත්කරුට අනවශ්‍ය අනුග්‍රහයක් ලබාදීම. | - | කොන්ත්‍රාත්කරුගෙන් හානි ගාස්තු අඩුකිරීමට පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | නොතිබුණි. එම නිසා කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි VIII 27.1 වගන්තිය ප්‍රකාරව හානි ගාස්තු වශයෙන් එකතුව රු.මිලියන 19.5ක් ඉල්ලුම් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී ඉල්ලුම් කර නොතිබුණි. | | | |
| (ඇ) | සම්ප්‍රේෂණ පද්ධතියේ ප්‍රතික්‍රියාකාරී බල කළමනාකරණය | පන්නිපිටිය කොටුමා උපපොළෙහි 100 MVAr BSC ක් සහ බියගම කොටුමා උපපොළෙහි Static Var System (SVS) පද්ධති ස්ථාපනයට එකතුව රු.මිලියන 3,806 ක් වෙන්කර තිබුණ ද ව්‍යාපෘතියේ කටයුතු ආරම්භයේ සිට වර්ෂ 2 ½ ප්‍රමාදයන් සහිතව පන්නිපිටිය කොටුමා උපපොළෙහි 100 MVAr BSC පද්ධතිය ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව එ.ජ.ඩො.මිලියන 1.5, යුරෝ මිලියන 3.76 සහ රු.මිලියන 166.05 ඇස්තමේන්තුගත පිරිවැයකට 2019 මැයි 09 දින පිරිනමා තිබුණි. අනෙකුත් කොන්ත්‍රාත්තුව විගණිත දිනය වූ 2020 ජුනි 01 දින වන විටත් පිරිනමා නොතිබුණි. | පිරිවැය වැඩිවීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට ඉඩ ඇත. | SESRIP ව්‍යාපෘතියේ ලොට් 7 පැකේජ A1 යටතේ කටයුතු සිදුකරමින් පවතින අතර පැකේජ 7 A2 (100 MVAr SVS බියගම කොටුමා උපපොළ) කොන්ත්‍රාත්තුව 2020-05-28 දින පිරිනමා තිබුණි. මෙය 2019 සිව්වන කාර්තුවේදී ප්‍රදානය කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය අභියාචනා කිරීම සහ ජනාධිපතිවරයෙන් පසු අමාත්‍යාංශ වෙනස්වීම හේතුවෙන් පරිපාලනය වෙනස්වීම නිසා ප්‍රදානය කිරීමට නොහැකි විය. සුහුරු රැස්වීම් මගින් විදේශ පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් කොවිඩ් 19 | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව නියාමනය කිරීමට අවශ්‍ය වේ. |

වසංගතය මධ්‍යයේ පිරිනැමීමට පෙර රැස්වීම් පවත්වා තිබුණු අතර කොන්ත්‍රාත්තුව 2020 මැයි 28 දින පිරිනැමීමට නියමිතය.

### 3.2 ඌන උපයෝජිත සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| -------- | ---------- | ------------------ | ------------ |
| ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්කවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 7,776 කට සමාන එජඩො මිලියන 54 ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර එදිනට එම ඉලක්කයෙන් සියයට 43.42 ක් පමණක් අත්කර ගෙන තිබුණි. | ණය නියෝජිත ආයතනය විසින් රු.මිලියන 22.81ක මුදලක් බැඳීම් ගාස්තු අයකර ගෙන තිබුණි. මුළු ප්‍රතිපාදනය ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 3 ½ තුලදී උපයෝජනය කළ නොහැකි වේ. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්ක ලඟාකර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්ක සමඟ අනුගත වීම අවශ්‍ය වේ. |

### 3.3 පද්ධති හා පාලනයන්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| -------- | ----------- | ----------------- | ------------ |
| ප්‍රධාන සංරචක 3ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය සහ නියාමනය ලංකා විදුලිබල මණ්ඩලයේ වෙනම අංශ ප්‍රධානීන් 03 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ පවතී. | නිසි සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම ප්‍රමාද වේ. | -එම- | අධීක්ෂණය සහ නියාමනය පිළිබඳව පාලනයන් ශක්තිමත් කළ යුතුය. |